අවස්ථාවේදී මට නම කියා කතා කිරීමට පුළුවන් කවුද සිටින්නේ කියා සෝදිසි කළ අවස්ථාවේදී කලින් ධර්මාශෝක රජු හා පැවති දැඩි සම්බන්ධතාවය නිසා පහත සඳහන් ගාථාවෙන් මිහිඳු මහ රහතන් වහන්සේ තමන් වහන්සේ හඳුන්වා දුන්හ.

"සමනා මයං මහා රාජ - ධම්ම රාජස්ස සාවකා
තමේව අනුකම්පාය - ජම්බුදීපා ඉධාගතා"

මහරජ අපි ධර්මරාජයන් වහන්සේගේ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ වෙමු. තොපට අනුකම්පා පිණිස දඹදිව සිට මෙහි පැමිණියෙමු.

මිහිඳු හිමියන් මෙසේ ප්‍රකාශ කළ විට දේවානම් පියතිස්ස රජු තෙමන්ගේ අදෘෂ්ට මිත්‍ර (පෙර නුදුටු) ධර්මාශෝක රජු පිළිබඳ මතකය අවදිවිය. එවිට මුව දඩයමේ යාම පිණිස ගෙනා දුනු හී ආදිට පසෙක තබා අවශ්‍ය පිළිසඳර - සාකච්ඡා - තොරතුරු කතා බස් කළහ. ඊට පසු වහ වහා නවා තැන් පහසුකම් - ලෙන් ආදිය පිළියෙළ කර දී දාන මාන පහසුකම් ආදිය ද සම්පාදනය කළහ.

මිහිඳු මහ රහතන් වහන්සේ ඊට පසු දිනම චුල්ල හත්ථි පදෝපම - මහා හත්ථි පදෝපම - විමානවත්ථු ආදී ලක්වැසියන්ට ගැළපෙන පරිසරය - වටපිටාව ආශ්‍රිත ධර්ම දේශනා ලිහිල් බසින් දේශනා කර වදාළහ. එයින් කලින් ඇදහූ මිත්‍යා විශ්වාස - ඇදහිලි අතහැර ධර්මාවබෝධය කළය.

චිත්ත රාජ කාලවේල වැනි යක්ෂයින් හා ගස් ගල් ඇදහිලි ආදිය ක්‍රම ක්‍රමයෙන් අතහැර බුදු දහම වැළඳගත් සිරි ලක්වැසියෝ මිහිඳු මාහිමියන්ගෙන් බ්‍රාහ්මී අක්ෂර - චිත්‍ර කලා ශිල්ප ආදිය ද ප්‍රගුණ කළහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ රුහුණු මායා පිහිටි යනුවෙන් එදා හැඳින්වූ හැම ප්‍රදේශයකම වෙහෙර විහාර චෛත්‍ය බෝධිඝර ප්‍රතිමා අදිය තනවන්නට හුරු පුරුදුවූහ

ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ ආධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය එළමල්දෙණියේ සාරානන්ද හිමියන් 2012 අප්‍රේල් මස 8 වන ඉරිදා ලංකාදීප පත්‍රයේ පළ කළ අශෝක රජුගේ ධර්ම ප්‍රචාරක සේවය පිළිබඳ ලිපිය වටිනා සාරාගර්භ එකක් වූ නිසාත්, අප ඉගෙන ගන්නා කාලයේදීත් විද්‍යාලංකාර (වර්තමාන කැලණි) විශ්ව විද්‍යාලයේදී හා විද්‍යාලංකාර මහ පිරිවෙන්දීත් 'අශෝකධංම' නමින් ලිපි කීපයක් සම්පාදනය කළ බව සිහිපත් වෙයි.

"කාලිංග යුද්ධය නිමවීමෙන් පසු අශෝක රජතුමා ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට පටන් ගත්තේය. ඒ අනුව සිය දරු මුණුබුරන්ට ද ප්‍රකාශ කළේ ධර්ම විජය සැබෑ විජය ලෙස සලකන ලෙසයි. එතුමා ඔටුනු පළාත් දොළොස්වන අවුරුද්දේ පටන් මෙම නව ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවූ බව දිල්ලියේ ඇති සියවැනි ..... ලිපියේ සඳහන් වේ. "සියළු දානයන් පරදවා ධර්ම දානය ජය ගනී යන උපදේශ පාඨය අනුව යමින් දහම ප්‍රචාරය කිරීමට රජතුමා මහත් උනන්දුවක් ගත්තේය.

සාරානන්ද හිමියන් මෙසේ සඳහන් කරන අතර වැඩි දුරටත් උන්වහන්සේගේ ලිපියේ "පියකු දරුවන්ට දක්වන සෙනෙහස මෙන් තම රටෙහි ජනතාවට ද මොහු තුළ තිබුණේ අසීමිත සෙනෙහසකි. මෞලි කාලිංග ලිපියේ සඳහන් වන්නේ සියලු ජනයා මාගේ දරුවෝය යනුවෙනි. මේ අනුව පැහැදිලි වන්නේ රජතුමාගේ පරම බලාපොරොත්තුව මහජනතාවට යහපත උදාකරලීමට බවයි."

අශෝක රජතුමාගේ ධර්ම ප්‍රචාරක සේවාවන්හි එක් අංශයක් වූයේ බුදු දහමෙහි සරල දහම් කොටස් පොදු මහජනතාව වෙත සමීප කරලීමයි. ඒ තුළින් පුද්ගලයාගේ දෛනික ජීවිතය සාර්ථක කර දීමට හැකි බව විශ්වාස කළහ.

'අශෝක දහම' යනුවෙන් හඳින්වූ මෙම ඉගැන්වීම් ඉරහඳ පවත්නා තෙක් තමාගේ දරුමුණුපුරන් ආදී කොට ඇති මතු පරම්පරා අතරද කල්ප කාලාන්තරයක් පවත්වයි එතුමා ප්‍රාර්ථනා කළේය. ධර්මය අනුගමනය කරන තුරු සමාජය තුළ සාමය හා සදාචාරය පවතින බව විශ්වාස කළේය.

අශෝක රජතුමා මෙහිදී තම ධනය සහ කාලයා ශ්‍රමය කෙතරම් වැය කළාද කියතොත් වැසිකිළියේදී සිට වුවත් තමන්ගෙන් අවශ්‍ය උපදේශ හා අනුශාසනා ලබාගැනීමට පසුබට නොවන ලෙසත් ප්‍රමාද නොවන ලෙසත් රාජ්‍ය නිලධාරීන්ගෙන් හා රටවැසියන්ගේ ඉල්ලා සිටියහ.

තම රටේ පමණක් නොව සුවණ්ණ භූමිය දැන් මියන්මාරය. තායිලන්තටව (සියම) තම්බපණ්ණිය - (ශ්‍රී ලංකාව) ආදී රටවල් නවය හට සුදුසු ධර්ම දූතයන් යැවූ අතර ශ්‍රී ලංකාව ගැන විශේෂ සැලකිල්ලක් දැක්වූහ. එදත් දඹදිව (ඉන්දියාව) සමඟ ශ්‍රී ලංකාව සමීප සම්බන්ධතා පැවැත්වූ නිසා තම පුතු මිහිඳු මහ රහතන් වහන්සේ සමඟ එවූහ

විශේෂයෙන් ධර්මාශෝක රජතුමා බුදු දහම වැළඳ ගත්තේද සිහසුනේ වැඩ හුන් නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගෙන් (හත් හැවිරිදි) "අප්පමාදො අමත පදං" යනාදී ගාථාව ශ්‍රවණය කිරීමෙනි, උන්වහන්සේ ධර්මාශෝක රජතුමාගේ මුණුපුරෙකි, ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේදී උඳුවප් මස පුර පසළොස්වක පුණු පොහෝදා ශ්‍රී ලංකාවට වැඩමවූ දඹදිව බුද්ධ ගයාවේ ජය ශ්‍රී විජය ශ්‍රී මහාබෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව වැඩමවා ගෙන පැමිණි සංඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේද රජතුමාගේ දියණියකි. ධර්මාශෝක මහ රජතුමාගේ අග මෙහෙසියවූ අසන්ධිමිත්‍රා බිසව තමන්ට වඩා බුදුරජාණන් වහන්සේ බුද්ධත්ව ලැබූ බුද්ධ ගයාවේ ජය ශ්‍රී බෝධීන් වහන්සේට ගරු සත්කාර කරන බව නොඉවසූ ඇය විසින් මිත්‍යා දෘෂ්ටිකයන් ලවා බෝධීන් වහන්සේ සහ මුලින් කපා ගිනි තබා විනාශ කරන ලදී. එම අවසානවන්ත සිද්ධියට මුහුණදීමට කලින් අපට ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ලබා ගන්නට පුළුවන් වීම භාග්‍යයකි. පිනකි.

සුපතිට්ඨිත රට්ඨනුරාධ පුරේ
සම දිට්ඨික දක්ඛින ශාඛ භවං
සුභ මෙඝ වනම්බර මෙඝ නිභං
ජයබෝධි මහං පණාමාමි වරං

අද දඹදිව පවා බුද්ධ ගයාවේ තිබෙන්නේ පසු කලෙක හටගත් ශ්‍රී මහා බෝධීන් වහන්සේ ය. එහෙත් අපේ ශ්‍රී ලංකාවේ බෞද්ධයන්ගේ පමණක් නොව චීන - ජපන් වියට්නාම් මියන්මාර් තායිලන්ත ආදී රටවල බෞද්ද භික්ෂූන් වහන්සේගේ හා ගිහි බෞද්ධයන්ගේ නොමඳ ගෞරවාදරභක්ති ප්‍රණාමයට පාත්‍රවෙයි. අපේ හිටපු ජනාධිපතිවරයෙක්ව ප්‍රේමදාස මහතා රන්වැටක් තනා ශ්‍රී මහා බෝධීන් වහන්සේට අනන්‍යාදර භක්තියෙන් පූජා කර තිබේ.

එසේම එදා බුදුරජාණන් වහන්සේ වැඩ සිටි සැවැත් නුවර ජේතවනාරාමයට ආසන්නව පිහිටා තිබෙන අනඳ බෝධියට ද සෑම දෙනාගෙම වන්දන මානනයට පාත්‍රවෙයි. බෝපත් පවා රැගෙන ගොස් පුද පූජා පවත්වයි. මේ පිළිබඳව කිව යුතු සාකච්ඡා කළයුතු කරුණු රාශියක් ඇතත් මේ ඊට අවස්ථාව නොවන බවද කිව යුතුය.

වරක් ආචාර්ය ඉත්තෑපාන ධම්මාලංකාර අනුනාහිමියන් පැවසූ පරිදි ශ්‍රී ලංකාවේ සෑම විහාරස්ථානයකම අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේගේ ප්‍රතිමාවක් තනවා පූජා සත්කාර ලැබෙන්නට සැලැස්වීම කාලෝචිතය.

එසේම ඕස්ට්‍රේලියාව ආදී රටවල වැඩ වසන භික්ෂූන් වහන්සේලා සහ ගිහි බෞද්ධයන් විසිනුත් අප සඳහන් කළ කාරණය පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත්ය. ■



## නොරටක දී

| | |
|---|---|
| ලෙන්ගතුකම ගුලි කරලා පිළිකන්නේ | තියාලා |
| වලාපටල ඉරා අලුත් දේශයකට | ගොඩවෙලා |
| ළඟ සිටිනුන් ගුවන් වෙනස් වන මගේදී | ගිහිල්ලා |
| මනුස්සකම ගමන් මල්ල අගින් බිමට | ඉහිරිලා |
| ගමේ චන්ද්‍රයා නගරේ මහල් උඩින් | පායලා |
| ඇලේ දොලේ පවන් නැතත් සුළං හමයි | වේලිලා |
| හඳුන්කූරු කපුරු පහන් සුවඳ හිතේ | දල්වලා |
| බුදුන් වඳිම් සිමෙන්තියේ ඉඳන් නිවන් මග | බලා |

අතුල වික්‍රම

# පහන් වැට

## සිත්තරී

සමිත බී. අටුවබැන්දෑල

සිත්තරී බලන් කඳුළු පිපුණා
සත්සරී අහන් තනුව බිඳුණා
කින්නරී ඉතිං හීය ඇනුණා
කින්නරා මං මේ ලිපිය එවනා

කිඳුරා නැටුවෙ ගම මැද්දේ කැලෑවේ
කිඳුරී ගැයුවෙ මැදපෙරදිග තලාවේ
කළඹා එව්ව ඊතලයක් විරහාවේ
වැදිලා කිඳුරු වැටුණායි සිහිමුලාවේ

සතේ නැතිව මැදපෙරදිග ගිය කිඳුරී
ගිනිකතරේ රියාල් වතුර හෙව් කිඳුරී
කඳුළු දමා ඉඳිපැලයක් හැදූ කිඳුරී
ඔටුවෙක් දැක පෙම හිතුණාද රන් කිඳුරී

රට යන්නේ මං අයියේ හෙටයි කියා
සිප බඳ කොමලතින් බත් කටකුත් කවා පියා
වෙලිලා උන් අපට මක් වූයේද කියා
කිඳුරා හිඳී පපුවේ අත් දෙකම තියා

දිසි මහවැලියේය කෙළ සිහිලැල්ලේයා
ටකරන් හෙවණැල්ලේය මද පවනැල්ලේයා
නුඹ සහ හීනේය හිත්මල් පලසේයා
උන් මට ලොල්ලේය දැන් ළතැවුල්ලේයා

පොලෙන් ගෙනා මල කනලා හිනාවුණ
තෑගි දුන්න පොඩි මාලය කර රැඳුණ
මල් අකුරින් නම් මහලා මට දුන්න
නුඹේ සෙවණෙ උන් මට මේ තැවුල් විණ

හැම්බේකන් චීස් පුඩින් නිති වලඳන්
පුන්චි ගෙයක් කතරේ එක තැනක හඳන්
බලලා යන්ට නෑයෝ ඔණෑය හිතන්
හීනෙන්වත් යළි එන්නැතිවාද කියන්.



## පඩි

දමිත් උදයංග දහනායක

ෆැක්ටේරියේ
පඩි වැඩි කලත් දවසින් දවස
ඉහලට නගින්නට අපිට
කොහොමටත් අමාරුය

000000

තාර පින්සල් පාර
ගෑවුණු නො ගෑවුණු කෙළවර තීරුවක
කහපාට සුදුගවුම් පොඩිය ඇඳි
මතක මීදුමාරය
නැ[illegible]යි හැමදාම

0000

කඳුළක් බේරේ වැවට වැටේ

## නුදුටු සිහිනයක්

මිදිවැල පල දරා
පොකුරු පොකුරු
දිලිසෙයි හිරු රැස් වැදී
ගෙනයයි මසිත
ඈත අතීතයට
තාත්තා කොළඹ ගෙනා
දුඹුරු කරදහි මල්ලේ
තිබූ මිදි පොකුරු වෙත

උතුරු කුරු දිවයිනෙන්
සයුර තරණය කර
සිරිලකට වැඩි මිදි
එදා රස වින්දේ එහෙදී
සහිනෙන් වත් නොසිතුනකි
මෙහි පැමිණ
මා'ගින්ම නෙලා ගත් මිදි
රස විදින බව මෙහිදී

ලක්ෂමී ගුණරත්න

## වස්සාන ආදරේ

ඔබ ළඟ නැති මුත් නෙතු කැල්මට
රුව ඇඳි සැඟවෙයි සාගර පත්ලට

තනිකම දැනෙනා මේ අඳුරේ
කරේ ඇයිද ඉවුරු තලන ආදරේ

සිත්පිත් නැතිව තලා මහද
වෙන්ව ගියේ ඇයි මා සකිසඳ

දිගු දෑස් දල්වා බලා මදෙස
තුන් සිත අවදිකරවා පවසන්න දැන්

සපුරා තහනම් කළේ
කොතැන සැඟවූයේද
උන්මාද වූ මනලෝලී
අපි අපේම වූ
වස්සාන ආ...ද...රේ...

කාන්ති වික්‍රමසූරිය